# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත

பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்

Chief Secretary's Office – North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය,කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் -Provincial Council Office Complex, Kurunegala.

**මූල්‍ය කළමනාකරණ අංශය**
நிதி முகாமைத்துவ பிரிவு
Financial Management Division


මගේ අංකය / எனது இலக்கம் / My No } NWP/CS/F/4/16

ඔබේ අංකය / உமது இலக்கம் / Your No }

දිනය / திகதி / Date } 2019.09.20

---

සියළුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**<u>චක්‍රලේඛ වයඹ පළාත් සභාවට අදාළ කරදීම.</u>**

මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2016.01.08 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2016 හි තුන්වන ඡේදය සංශෝධනය කරමින් නිකුත් කරන ලද 2019.07.22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2016(1) හි "රජයට අවශ්‍ය හදිසි සේවා ඉටුකිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම " පිළිබඳ චක්‍රලේඛයේ <u>**දෙවන ඡේදය පහත ආකාරයට සංශෝධන සහිතව**</u> වයඹ පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා ගරු.ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2019.09.09 වන දින ලැබී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක NWP/GOV/AD /01/1/1/17/2 හා 2019.09.10 දින දරණ ලිපියෙන් මා වෙත දැනුම් දී ඇත.

මෙම චක්‍රලේඛය <u>www.treasury.gov.lk</u> යන වෙබ් අඩවියෙන් භාගත කර අවශ්‍ය කටයුතු ඉටුකරන ලෙස කාරුණිකව දන්වමි.

<table>
<tr><th>චක්‍රලේඛ අංකය හා දිනය</th><th colspan="2">විස්තරය</th></tr>
<tr><td rowspan="3">2019.07.22 දිනැති අංක 01/2016(1) රාජ්‍ය මුදල් චක්‍රලේඛය.</td><td colspan="2">02. " මෙවැනි ගෙවීම් දින 90 ක් නොඉක්මවන්නා වූ කෙටිකාලීන පදනමක් මත ලබාගත යුතු හදිසි සේවාවන් සඳහා පමණක් සීමා විය යුතු අතර එබඳු සේවාවන් සඳහා බාහිර පුද්ගලයෙකු/පුද්ගලයින් කණ්ඩායමකට හෝ විශ්‍රාමික රජයේ නිලධාරීන්ට ගෙවිය හැකි උපරිම මුදල රු.150,000/=කි. මේ සඳහා අත්තිකාරම් මුදල් නොගෙවිය යුතු අතර, ගෙවීම් කළ යුත්තේ අදාල කාර්ය ඉටු කළ පසුව <u>පහත නිලධාරීන්ගේ</u> අනුමැතිය මත වේ.</td></tr>
<tr><td>මුදල</td><td>අනුමත කරන නිලධාරියා</td></tr>
<tr><td>රු 25,000/- දකවා<br>රු.50,000/- දක්වා<br>රු.150,000/- දක්වා</td><td>ගණන් දීමේ නිලධාරී<br>ප්‍රධාන ගණන් දීමේ නිලධාරී<br>ප්‍රධාන ලේකම්</td></tr>
</table>

ජී.ජී.සී.ප්‍රේමකුමාර,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)

අත්/කලේ,පී.බී.එම්.සිරිසේන,
ප්‍රධාන ලේකම්,
වයඹ පළාත.

පිටපත : - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන)
පරිගණක වැඩසටහන් විශ්ලේෂක

අ.ක.ස.
අන්තර්ජාලයට මුදාහැරීම සඳහා.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } Tel : 037-2228019, Fax : 037-2223777, e-mail : chiefsecretary@nw.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதான செயலாளர் அலுவலகம் / Chief Secretary's Office } Tel : 037-2231769-72, Fax : 037-2222234, e-mai :csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) / பிரதி பிரதான செயலாளர் (நிதி முகாமைத்துவம்) / Deputy Chief Secretary (Financial Managment) } Tel : 037-2223731, Fax : 037-2228128, e-mail : dcsfnnwpc@yahoo.com